# මොරටුව මහා නගර සභාව

## 2026 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

2026 වර්ෂය වෙනුවෙන් මෙම මහා නගර සභාවේ මෙහි පහත දැක්වෙන මූල්‍ය අගයන් තුලට ගැනෙන කාණ්ඩ වල ව්‍යාපෘති ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සේවා සැපයුම්කරුවන්ගෙන් හා මෙම සභාව මගින් සෘජු ශ්‍රමිකව දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපෘති ඉටුකිරීමේදී අවශ්‍ය වන පුහුණු ,අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින්ගේ ශ්‍රමය දෛනික කුලී පදනම මත සපයා ගැනීම සඳහා ශ්‍රමිකයින්ගෙන් හා සේවා සැපයුම්කරුවන්ගෙන් සහ මහා නගර සභා බල ප්‍රදේශය තුල අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම සඳහා උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2025.10.15 දින සිට 2025.11.31 වන දින පස්වරු 3.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

2026 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් මෙම සභාවේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පුද්ගලයින් හෝ ආයතන සහ සෘජු ශ්‍රමික ව්‍යාපෘති ඉටු කිරීමේදී අවශ්‍ය පුහුණු, අර්ධ පුහුණු සැපයීමට කැමති කොන්ත්‍රාත්කරුවන් හා ශ්‍රමිකයින් ඒ සඳහා මෙම සභාව මගින් නොමිලයේ නිකුත් කරණු ලබන අයදුම්පත් ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කර හෝ තමන් විසින්ම අදාල සුදුසුකම් හා හැකියාවන් ඇතුලත්කර සකස් කරන ලද අයදුම්පතක් මඟින් හෝ අදාල සියළු ලිපි ලේඛණ සමඟ නියමිත කාලය තුල මෙම සභාවට ඉදිරිපත් කල යුතු අතර අපේක්ෂිත ලියාපදිංචියට අදාළ ගාස්තු මුදල වලංගු මුදල් වලින් පමණක් මෙම සභාව වෙත නියමිත දින නියමිත වේලාවට පෙර ගෙවිය යුතුය.එසේම, වලංගු චෙක්පත් මඟින් අදාළ ගාස්තු මුදල් ගෙවනු ලබන්නේ නම් අදාළ චෙක්පත නිෂ්කාශනය වූ පසුව ලියාපදිංචිය සිදු කරනු ලැබේ.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහල වම් කෙලවරේ "කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2026" යනුවෙන් පැහැදිලිව සටහන් කර ලියාපදිංචි තැපැල මගින් හෝ අතින් ගෙනවිත් හෝ "නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව - මොරටුව" යන ලිපිනයට ලැබෙන සේ ලැබීමට සැලැස් විය යුතුය. නියමිත දින නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරණු ලබන හෝ ලැබෙන හෝ අයදුම්පත් පිළිබඳව සලකා බැලීම සිදු නොකරනු ලබන අතර, තැපෑලේදී නැතිවන හෝ අස්ථානගතවන හෝ අයදුම්පත් සම්බන්ධයෙන් මෙම සභාව විසින් වග කියනු නොලැබේ.

**<u>කොන්ත්‍රාත් කාණ්ඩය අංක - 01</u>**

05. මාර්ග, කාණු, ගොඩනැගිලි, ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම් ඇතුළු ක්‍රීඩා භූමි සකස් කිරීම් හා සංවර්ධනය කිරීම් සඳහා ලියාපදිංචිය.

| | ලියාපදිංචි සීමාව | 2025 වර්ෂයේ අය කර ඇති ලියාපදිංචි ගාස්තුව | 2026 වර්ෂයට යෝජිත ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|---|
| I. | රු.500,000.00 දක්වා (ලක්ෂ පහක්) | රු.6,500.00 | රු.6,500.00 |
| II. | රු.1,000,000.00 දක්වා (ලක්ෂ දහයක්) | රු. 8,500.00 | රු. 8,500.00 |
| III. | රු.2,000,000.00 දක්වා (ලක්ෂ විස්සක්) | රු. 10,000.00 | රු. 10,000.00 |
| IV. | රු.4,000,000.00 දක්වා (ලක්ෂ හතලිහක්) | රු.12,500.00 | රු.12,500.00 |

**<u>කොන්ත්‍රාත් කාණ්ඩය අංක - 02</u>**

ආදාහනාගාර ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා ලියාපදිංචිය

| | ලියාපදිංචි සීමාව | 2025 වර්ෂයේ අය කර ඇති ලියාපදිංචි ගාස්තුව | 2026 වර්ෂයට යෝජිත ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|---|
| I. | රු.4,000,000.00 (ලක්ෂ හතලිහක්) | රු. 6500.00 | රු. 6500.00 |

**කොන්ත්‍රාත් කාණ්ඩය අංක - 03**

ඇළුමිනියම් සහ වානේ පිරිසැකසුම් (Aluminium and Steel Fabrication) වැඩ ඉටුකිරීම් හා එහි අළුත්වැඩියා සිදුකිරීම් සඳහා ලියාපදිංචිය).

| ලියාපදිංචි සීමාව | 2025 වර්ෂයේ අය කර ඇති ලියාපදිංචි ගාස්තුව | 2026 වර්ෂයට යෝජිත ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| I. රු.2,000,000.00 (ලක්ෂ විස්සක්) | රු.4500.00 | රු.4500.00 |
| II. රු.4,000,000.00 (ලක්ෂ හතලිහක්) | රු.6500.00 | රු.6500.00 |

**කොන්ත්‍රාත් කාණ්ඩය අංක - 06**

භූමි අලංකරණ කටයුතු හා ඇවිදින මංතීරු සැකසීම සඳහා ලියාපදිංචිය

| ලියාපදිංචි සීමාව | 2025 වර්ෂයේ අය කර ඇති ලියාපදිංචි ගාස්තුව | 2026 වර්ෂයට යෝජිත ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| I. රු.2,000,000.00 (ලක්ෂ විස්සක්) | - | රු.4500.00 |

**කොන්ත්‍රාත් කාණ්ඩය අංක - 07**

ජල ආරක්ෂණ කටයුතු (Water Proofing) ඉටුකිරීම සඳහා ලියාපදිංචිය

| ලියාපදිංචි සීමාව | 2025 වර්ෂයේ අය කර ඇති ලියාපදිංචි ගාස්තුව | 2026 වර්ෂයට යෝජිත ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| I. රු.2,000,000.00 (ලක්ෂ විස්සක්) | - | රු.4500.00 |

**කොන්ත්‍රාත් කාණ්ඩය අංක - 04**

මහා නගර සභා බල ප්‍රදේශය තුල අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම්

| සීමාව | 2025 වර්ෂයේ අයකර ඇති ලියාපදිංචි ගාස්තුව | 2026වර්ෂයට යෝජිත ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| සීමා පැනවීම් නැත. | රු.700.00 | රු.700.00 |

**කොන්ත්‍රාත් කාණ්ඩය අංක - 05**

සභාවේ සෘජු ශ්‍රමික කර්මාන්ත ඉටුකිරීමේදී අවශ්‍ය වන බාහිර පාර්ශවයේ පුහුණු , අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන්ගේ ශ්‍රමය දෛනික කුලී පදනම මත සපයා ගැනීම සඳහා ලියාපදිංචිය. (පෙදරේරු වැඩ, වඩුකාක,පින්තාරු සහ ජලනල කාර්මික යනාදී සේවාවන්)

| සීමාව | 2025 වර්ෂයේ අයකර ඇති ලියාපදිංචි ගාස්තුව | 2026 වර්ෂයට යෝජිත ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|
| | රු.700.00 | රු.700.00 |

**කොන්දේසි හා නිර්නායක**

I. මෙම සභාවේ ලියාපදිංචි කරවා ගනු ලබන කොන්ත්‍රාත්කරුවන්ට අමතරව, පිටස්තර කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා ආයතනවලින් තත්කාලයේ පවතින අවශ්‍යතාවයන් මත ලංසු / මිල සැදහුම් කැඳවීම් හා ව්‍යාපෘති ඉටු කරවා ගැනීමේ අයිතිය සම්පූර්ණයෙන් සභාව සතු වේ.

මෙයට පෙර වර්ෂ වලදී මෙම සභාවෙන් භාරගත් ව්‍යාපෘති සතුටුදායක ලෙස ඉටු නොකරන ලද හෝ සම්පූර්ණ කිරීමට අපොහොසත් වී කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙන් අපලේඛණගත කරන ලද (Blacklisted) කොන්ත්‍රාත්කරුවන් හා කොන්ත්‍රාත් ආයතනවල සහ සමාගම්වල ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. රු.1,000,000.00 සිට රු.4,000,000.00 දක්වා කර්මාන්ත ඉටු කිරීමට මුල් වරට මෙම සභාවේ ලියා පදිංචි වන කොන්ත්‍රාත්කරුවන් හෝ ආයතන හෝ සමාගම් හෝ මෙයට පෙර ව්‍යාපෘති ඉටුකර තිබීමේ පලපුරුදුකම්, හැකියාවන් සහ සුදුසුකම් සනාථ කිරීම වශයෙන් අභ්‍යාස හා ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ C-9 (රු. 1,000,000/- රු. 4,000,000.00) සිට C-8 (CIDA) දක්වා වලංගු ලියාපදිංචි සහතිකය සහ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කල යුතුය.

III. රු.500,000.00 (රු.ලක්ෂ පහක්) සීමාව තුල මුල්වතාවට ලියාපදිංචි වන කොන්ත්‍රාත්කරුවන් හා ආයතන තම සුදුසුකම් හා හැකියාවන් ඇතුලු පලපුරුදුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කල යුතු අතර, අභ්‍යාස හා ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ (CIDA) ලියාපදිංචි සහතිකය අවශ්‍ය නොවේ. එසේ වුවද, සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

IV. මෙයට පෙර වර්ෂවල මෙම සභාවේ අවම සීමාව වන රු.500,000.00 (ලක්ෂ පහක්) තුල ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් විසින් භාර ගනු ලැබූ ව්‍යාපෘති සතුටුදායකව හා සාර්ථක ලෙස ඉටුකර භාර දී ඇත්නම් එම කොන්ත්‍රාත්කරුවන්ට හා ආයතනවලට ඔවුන් ලියාපදිංචි වූ අවම සීමාව වන රු.500,000.00 සිට ඊළග සීමාව වන රු.1,000,000.00 සීමාව දක්වා අභ්‍යාස හා ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ (CIDA) ලියාපදිංචි සහතිකය නොමැතිව ලියාපදිංචි වීමට හැකියාව ඇත.

V. පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් සහ අනතුරුදායක ගස් කපන්නන් ලියාපදිංචි කිරීම සිදු කිරීමට පෙර ඔවුන්ගේ හැකියාවන් පිළිබඳව සභාවේ තාක්ෂණ නිලධාරීගේ නිර්දේශයක් ලබා ගැනීම සිදු කරනු ලැබේ.

VI. එකතු කල අගය මත බදු ගෙවීම සඳහා (vat බදු) ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කල යුතුය.

**2025.10. 13** වන දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය,

එල්.පී.මනෝජා එස්.පතිරණ,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.